**කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

# ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

## පුරප්පාඩු

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුර සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

---

## 01. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - තනතුරු 01 - (MA 1 – 2)

---

**සුදුසුකම්** :-

**බාහිර** -

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත්වීම.

සහ

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්වීම.

**අභ්‍යන්තර** -

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත් වී දැනට ප්‍රාථමික - ශිල්පීය නොවන (PL 1)– හා ප්‍රාථමික - ශිල්පීය (PL 3)– වැටුප් කාණ්ඩයේ අයට මේ සඳහා අයදුම් කල හැකිය.

---

**වැටුප් පරිමාණය** - **MA 1-2** - 2016 - රු. 27,910 - 300x10-350x07-600x12-710x12-49,080/-
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව, 2020.01.01 වර්ෂයේ සිට හිමිකම් ඇත.)
2019.01.01 දිනට වැටුප රු. 25,018.00 හා ගැලපුම් දීමනාව රු. 1,200.00 ක් වේ.
(අමතරව රජය මඟින් අනුමත ජීවන වියදම් දීමනාව සඳහා හිමිකම් ලබයි.)

---

**බඳවා ගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

---

**වයස් සීමාව** -

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**උක්ත තනතුර සඳහා අදාල පොදු කොන්දේසි** -

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- මානසික හා කායික වශයෙන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු විය යුතුය.
- ඉතා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- ඉහත තනතුරට බඳවා ගන්නා බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයක් සැපිරිය යුතුය. ඔහු/ඇය එම කාලසීමාව අවසානයේ දී පෙන්වනු ලබන සතුටුදායක කාර්ය සාධනය සහ පැවැත්ම අනුව, තනතුරෙහි ස්ථිර කරනු ඇත. දැනටමත් තනතුරෙහි ස්ථිර කර ඇති අභ්‍යන්තර අයදුම්කරුවන් වසර 01 ක වැඩබලන කාලසීමාවකට යටත් වනු ඇත.
- ඉහත තනතුරට බඳවා ගැනීම් අදාල තනතුරෙහි ආරම්භක වැටුප් පියවරට වේ.
- සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 08% ක් අයකර ගනු ලබන අතර ඊට ආයතනයේ දායකත්වය 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් වේ.

අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල ඡායා පිටපත් ස්වකීය අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඇ) සේවා පළපුරුද්ද පිලිබඳ සහතික
(ඈ) ජාතික හැඳුනුම්පත

දැනට රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ දෙපාර්තමේන්තුවල සේවය කරන අය තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් එවිය යුතු අතර අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැකි බවට ආයතන ප්‍රධානියා සහතික කල යුතුය. ඥාතීන් නොවන ඔබ පිලිබඳව විමසිය හැකි දෙදෙනෙකු ඇතුලත්ව සම්පූර්ණ විස්තර සහිත අයදුම්පතක් තමා විසින් සහතික කරන ලද සහතිකවල පිටපත් සමග 2019.09.03 දිනට ප්‍රථම **කළමනාකාර - පරිපාලන හා මානව සම්පත්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලු පාර, ගල්කිස්ස** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහල වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කල යුතු අතර කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

බඳවා ගැනීමට කිසිදු ආකාරයකින් බලපෑමක් කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ-විදුහල්පති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
අංක 582, ගාලු පාර
ගල්කිස්ස.

Source: www.cgtti.lk (2019.08.29)